INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

JDS — Journalists for Democracy in Sri Lanka

## ඒකාබද්ධ මාධ්‍ය නිවේදනය: ශ්‍රී ලංකාව - මර්දනය යළිත් ඇරඹේ

2020 ජනවාරි 13

**ජොහැන්නස්බර්ග්:** ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ නායකත්වයෙන් යුත් අලුත් ආණ්ඩුව ශ්‍රී ලංකාව හමුදාකරණයේ සහ ආරක්ෂණයේ උපාය මාර්ගයට මුල පුරමින්, විවේචකයන් හා මානව හිමිකම් ක්‍රියාධාරීන් බිය ගැන්වීමේ භයංකර ක්‍රියාදාමයක් ආරම්භ කර ඇතැයි මානව හිමිකම් සංවිධාන දෙකක් වන සත්‍යය සහ යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP) සහ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මාධ්‍යවේදියෝ (JDS) ප්‍රකාශ කර සිටී.

ජනාධිපතිවරණයට පෙරත්, ඉන් පසුවත්, මාධ්‍යවේදීන්, මානව හිමිකම් ආරක්ෂකයන්, නීතිඥයන්, විද්‍යාර්ථීන් සහ විපක්ෂයේ තැනැත්තන් ඉලක්ක කරගත් බිය වැද්දීම් සහ තර්ජන පිලිබඳ සිද්ධි 69 ක විස්තර, ශ්‍රී ලංකාව තුළ වාසය කරන නිසා ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් නම් කළ නොහැකි ක්‍රියාධාරීන්ගේ උදව්ව ලබාගෙන, මෙම සංවිධාන දෙක විසින් ලේඛනගත කර තිබේ. ඇතැම් අවස්ථාවල තර්ජනය කොයිතරම් දරුණුද කියතොත් ඒවාට මුහුණ දුන් පුද්ගලයන් රට හැර පලා ගොස් තිබේ.

*"අපට මේ දැකගන්නට තිබෙන්නේ වගඋත්තරකාරිත්වය සම්බන්ධයෙන් දැරෙන්නාවූ කවර උත්සාහයක් වුවද සිඳ දැමීමක් සහ වඩාත් දියුණු සහ හිරිහැරකාරී සෝදිසි කිරීම් මගින් ශ්‍රී ලංකාවේ පුරවැසි අවකාශය බරපතල ලෙස හකුලා දැමීමකි,"* යි ITJP විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය. *"පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් පසු වැඩි කරන ලද ශ්‍රී ලංකාවට දෙනු ලබන ආරක්ෂක ආධාර මානව හිමිකම් ආරක්ෂකයන් සහ මාධ්‍යවේදීන්ට එරෙහිව යොදා නොගන්නා බවට ජාත්‍යන්තර ප්‍රජාව සහතික විය යුතුය."*

ගෝඨාභය රාජපක්ෂ සිය පැරණි හමුදා රෙජිමේන්තුවේ සාමාජිකයන් ගණනාවක් බලධාරීන් ලෙස පත් කිරීම මගින් ආණ්ඩුව පුරා සිය අඩුබඩු විහිදුවා ඇති ආකාරය මෙන්ම, පොලිස් සහ බුද්ධි ක්‍රියාකාරකම් වැඩි වැඩියෙන් හමුදාකරණය කොට ඇති ආකාරයත් වාර්තාවේ චිත්‍රණය කර ඇත.

*"දූෂණ හෝ යුද අපරාධ වලට හෝ සම්බන්ධ බවට මීට ඉහතදී චෝදනා ලද පුද්ගලයෝ දැන් යළිත් බලය ලබා සිටිති. මෙතෙක් 'රහස්‍ය රාජ්‍යය' ලෙසින් ක්‍රියාත්මක වූ බලවේග දැන් බලතල සහිතවම විවෘතව කලඑළි බැස සිටී,"* යි ප්‍රකාශ කළ JDS සංවිධානයේ භාෂණ අබේවර්ධන, එය කලක් හඬක් නැගූ මාධ්‍යවේදීන්, වෘත්තීය සමිති ක්‍රියාකාරීන් හා මානව හිමිකම් ක්‍රියාධරයන් නිහැඬියාවක ගිල්වා ඇති බව වැඩිදුරටත් කියා සිටියේය.

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT